# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 173 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30/01/2024<br>පැය 0800 |

# මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අයියන්කන්කුලම් පොලිස් ස්ථානය.**

2024.01.29 වන දින සවස් කාලයේ අයියන්කුලම් පොලිස් වසමේ පුත්තුවෙට්ටුවාන් ප්‍රදේශයේදී අයියන්කන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන මාන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අයියන්කන්කුලම් පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – රත්නපුර පොලිස් ස්ථානය.**

2024.01.29 වන දින දහවල් කාලයේ රත්නපුර පොලිස් වසමේ ගෝනකුඹුර ප්‍රදේශයේදී රත්නපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 75 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන ගෝනකුඹුර, රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

## 03. මාරක රිය අනතුරක් - වීරගුල පොලිස් වසම.

2024.01.29 වන දින උදෑසන කාලයේ වීරගුල පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ මහවිට හන්දිය අසලදී කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ ලොරි රථයක මාර්ගයේ එම දිසාවටම ගමන්ගත් පදිකයෙකු ගැටී විසිවී ගොස් කාර් රථයකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා ගම්පහ රෝහලට ඇතුලත් කිරිමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වන යක්කල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වීරගුල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - බිබිල පොලිස් වසම.

2024.01.29 වන දින රාත්‍රී කාලයේ බිබිල පොලිස් වසමේ රදලියද්ද සිංහපුර මාර්ගයේ උස්සාගල ප්‍රදේශයේදී බිබිල දෙස සිට මඩකලපුව දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු බිබිල රෝහලට ඇතුලත් කර පසුව වැඩිදුර ප්‍රතිකාර සඳහා බදුල්ල රෝහල වෙත මරුකර යවා ඇති අතර එහිදී ප්‍රතිකාර ලබමින් සිටි තුවාලකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වන දම්පුරන, කොටියාකුඹුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බදුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බිබිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.